**සුරාබදු ආඥාපනත**

**අංක 09/2018 දරන සුරාබදු නිවේදනය**

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තිය සමඟ කියවනු ලබන 25 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මඟින් 2017 දෙසැම්බර් මස 11 වන දින අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1004 දරන සුරාබදු නිවේදනයේ 1 වන උප ලේඛනයේ අංක 3 හි දැක්වෙන රා බෝතල් කිරීමේ බලපත්‍ර ගාස්තුව 2018 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 මාර්තු 29 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| ***I වැනි තීරුව*** | ***II වැනි තීරුව*** | |
|---|---|---|
| **බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය** | **වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රුපියල්)** | **ඇපය (රුපියල්)** |
| (i) රා බෝතල් ගත කිරීමේ බලපත්‍රය | 500,000.00 | - |